

# ජාතික නාමල් උයන අප සතු මා හැඟි දායාදයකි.

ලොව අන් රටවල් සමඟ සසඳා බලන කළ ප්‍රමාණයෙන් ඉතා කුඩා රටක් වුවත් ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත් අතින් පොහොසත් රටකි. ගහකොළ, සතාසීපාවා, දර්ශනීය වෙරළ තීරයන්, ගංගා ඇළ දොළ, දිය ඇලි මෙන්ම සුවිශේෂී වූත් දර්ශනීය වූත් ස්වභාවික සම්පත් වලින් අනූන පරිසර පද්ධතීන්ද මේ අතර වේ. ඉහතින් දැක්වූ ස්වභාවික සම්පත් සම්භාරය ඇසුරින් ගොඩනැගුණු දකුණු ආසියාවේ විශාලතම රෝස තිරුවානා නිධිය පිහිටා තිබෙන ගල්කිරියාගම ජාතික නාමල් උයන වනාහි ශ්‍රී ලංකා මාතාව සතු මාහැඟි ආභරණයකි.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්කිරියාගම උල්පත ගම නම් වූ ග්‍රාම නිලධාරී වසම තුළ ජාතික නාමල් උයන පිහිටා තිබේ. මෙය කොළඹ සිට කිලෝමීටර් 159ක් දුරින් පිහිටා ඇති අතර දඹුල්ල නගරයේ සිට කැකිරාව දෙසට එන විට මඩාටුගම හංදියෙන් වමට හැරී ආඩියාගල දෙසට කිලෝමීටර් 8ක් පමණ ගමන් කිරීමෙන් අනතුරුව හමුවේ.

පුරාවිද්‍යාත්මක නටබුන්, රෝස තිරුවානා නිධිය, නා වනය හා ඒ ආශ්‍රිත ශාක හා සත්ත්ව ප්‍රජාවගෙන් සමන්විත වන ජාතික නාමල් උයන සැබැවින්ම ශ්‍රී ලාංකිකයකු විසින් අනිවාර්යෙන්ම නරඹා එහි සුන්දරත්වය විඳ ගත යුතු පරිසර පද්ධතියකි.

## ජාතික නාමල් උයනෙහි වැදගත්කම

ජාතික නාමල් උයන සතුව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් රැසක් පවතී. මෙහි ලිඛිත ඉතිහාසය දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය සමය දක්වා විහිදී යයි. දේවානම්පියතිස්ස රජු මහමෙව්නා උයන ඉදිකරවීමට පෙර එබඳු උයනක් නාමල් උයන ආශ්‍රිතව පිහිටුවීමට සැලසුම් කළ බවත් පසුව එම අදහස කිසියම් හේතුවක් නිසා අතහැර දැමූ බවත් කියවේ. දේවානම්පියතිස්ස රජු සමයෙන් පසුව මෙම ප්‍රදේශයට වැදගත් සටහනක් එක් වන්නේ ක්‍රි.ව. අටවැනි සියවසේ හතරවැනි දප්පුල රජු සමයේදීය. මෙහිදී කියවෙන ආකාරයට දප්පුල රජු සමයේදී මෙම නාමල් උයන මිනිසුන් සඳහා වෙන් කළ අභය භූමියක් ලෙස පැවතුන බව සඳහන් වේ. විවිධ වූ හේතූන් නිසා රාජ උදහසට භාජනය වන මිනිසුන් මෙම අභය භූමියට ගෙනවිත් මුදාහරිනු ලබයි. එහිදී වන අරණ ආශ්‍රිතව භාවනා යෝගීව වැඩ සිටින භික්ෂූන් වහන්සේලාගේ ඇසුර නිරන්තරයෙන්ම ඔවුන් වෙත ලැබේ. ඔවුන් වඩනා හිමිවරුන්ට නිරන්තර ඇප උපස්ථානයේ යෙදෙමින් ඔවුන් ඇසුරෙහි ජීවත්වන වරදකරුවන් අවසානයේ යහපත් පුරවැසියන් බවට පත්ව වන අරණෙන් නික්මෙන බව කියවේ. ඒ අනුව මෙතෙක් ලොව පැවැති ලිඛිත ඉතිහාසයක් ඇති එක මිනිස් අභය භූමිය ලෙස ජාතික නාමල් උයන ඉතිහාසයට එක්වේ.



රෝස තිරුවානා නිධිය

ජාතික නාමල් උයන එහි ඇති රෝස තිරුවානා නිධිය නිසාද පුරාවිද්‍යාත්මකව ඉතිහාසයට එක්වේ. ඉතා ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත වන රෝස තිරුවානා නිධිය දකුණු ආසියාවේ පවතින විශාලතම රෝස තිරුවානා නිධිය බවට විශ්වාස කෙරේ. හෙක්ටයාර් 105ක් පමණ පුරා විසිරී පවතින රෝස තිරුවානා නිධිය ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වන බවද කියවේ. මෝගල් අධිරාජ්‍යයා ඔහුගේ ප්‍රිය බිරිඳ වූ මුම්ටාස් මහල් සිහිවීම පිණිස "ටජ්මහල්" ප්‍රාසාදය ඉදිකිරීමේදී එහි ඉදිකිරීම් කටයුතු සඳහා රෝස තිරුවානා නිධියෙන් රෝස තිරුවානා ගෙන ගිය බව පුරාවෘත්තවල සඳහන්වේ.

## නා ගස ගැන තොරතුරු බිඳක්.

නා ගස වනාහී ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, අන්දමන් දූපත් ආදී තෙත් කලාපීය රටවල වැඩෙන ශාකයකි. බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන ආකාරයට සුමන, රේවත සහ සෝභිත යන බුදුවරුන්ට බුදුවීම සඳහා සෙවන සැලසුවේ නා ගස වන අතර මතු බුදුවන මෛත්‍රී බෝසතාණන් වහන්සේද නා ගසක් මුල බුද්ධත්වය ලබන බව විශ්වාස කෙරේ. වර්තමානයේ වුවද නා, බෝ, සපු යන ශාක තුන තුන්තරා බෝධිය වශයෙන් විහාර ආරාමවල රෝපණය කර පුද පූජා පවත්වනු දක්නට ලැබේ. ඇසතු බෝරුක සේම පූජනීත්වයෙන් පුද පූජෝපහාර ලබන වෘක්ෂයක් වශයෙන් නා ගසට වැදගත්කමක් හිමිවේ. නා ගස පූජනීය ශාකයක් වනවාසේම ඖෂධීය ගුණයෙන්ද අනූන ශාකයක් ලෙස වැදගත්වේ. නා ගසේ කොළ, පොතු, මුල්, මල්, ඇට සහ අරටුව ආදී සෑම කොටසක්ම දේශීය වෛද්‍ය විද්‍යාවේදී භාවිතා කරයි. නා ඇට වලින් සාදා ගන්නා තෙල් හන්දිපත් වේදනා සඳහා ප්‍රතිකාර කිරීමට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් වශයෙන් භාවිතා කෙරේ.



නා ගස

ගෘහාශ්‍රිතව නා ගස් වගා කිරීමෙන් එම ගෘහයට සතුට, සමාදානය සහ සෞභාග්‍ය උදාවන බව විශ්වාස කෙරේ. පුරාතන සංදේශ කාව්‍යවල නා දළු කාන්තාවන්ගේ තොල්වලට උපමා කළ අවස්ථාවන් හමුවේ. වර්තමාන ගීත සාහිත්‍යයේ වුවද නා දළු විශේස උපමා අලංකාර වශයෙන් ගීත රචකයින් භාවිතා කරනු දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ නා ගස් විශේෂ දෙකක් හමුවේ. එනම්, දිය නා (Mesua Ferrea) සහ බටු නා (Mesua Nagassarium) වේ. මේ නා විශේෂ දෙක අතුරින් 85%ක් පමණ ඇත්තේ දිය නා විශේෂයයි. දිය නා ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික ශාකයක් වන අතර එය 1986 වසරේ පෙබරවාරි 26 වන දින ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

නා ගස සාමාන්‍යයෙන් අඩි 25-30 ක් පමණ උසට වැඩෙන අතර මෙය ඉතාමත් ශක්තිමත්භාවයෙන් යුතුව වැඩේ. නා දැව පන්සල් හා දේවාල ඉදිකිරීම සඳහා යොදා ගනී. ජාතික නාමල් උයනෙහි අක්කර 260ක් පමණ වපසරිය පුරාම නා ගස් බහුලව දක්නට ලැබීම විශේෂත්වයකි. මේ අතර ඉතා පැරණි වුත්, දැවැන්ත වුත් නා ගස් ඉතා සශ්‍රීකව වැවී තිබීම මෙහි ඇති තවත් සුවිශේෂත්වයකි.



නා මල

## නා මල් උයන ආශ්‍රිත ජෛව විවිධත්වය

ජාතික නාමල් උයන ආශ්‍රිතව සුවිශේෂී ශාක සහ සත්ත්ව විවිධත්වයක් දැක ගත හැකිය. මෙහි ප්‍රධාන වශයෙන්ම නා ශාකය හැරුණු කොට මිල්ල, හල්මිල්ල, ගොඩකිරල, තේක්ක ආදී වටිනා ශාක විශාල ප්‍රමාණයක් පවතී. නා මල් උයන ආශ්‍රිතව ශාක විශේෂ 102ක් පමණ වාර්තා වන බව හඳුනාගෙන ඇති අතර ඉන් විශේෂ 72 ක් ඖෂධීය වටිනාකමින් යුතු ශාක බවද හඳුනාගෙන ඇත. නාමල් උයනෙහි සත්ත්ව විවිධත්වය පිළිබඳව සැලකීමේදී මෙම පාරිසරික කලාපය තුළ කෘමි විශේෂ 75ක් පමණ හමුවන බව වාර්තාවේ. පක්ෂී විශේෂ 18ක් දිය උල්පත් ආශ්‍රිතව උභය ජීවී විශේෂ ගණනාවක් හා දේශීය මත්ස්‍ය විශේෂ ගණනාවක්ද හඳුනාගෙන ඇත. තවද විෂ





සහිත වූත් විෂ රහිත වූත් උරග විශේෂ ගණනාවක් මෙහිදී දැක ගත හැකි අතර අලියා, මුවා, රිළවා ආදී ක්ෂීරපායි සතුන්ද මෙහි වාසය කරනු දැක ගත හැකිය.

ජාතික නාමල් උයන සංරක්ෂණය කළ යුත්තේ ඇයි?

ජාතික නාමල් උයන වනාහි දකුණු ආසියාවේ පිහිටි විශාලම රෝස තිරුවානා නිධිය පිහිටා තිබෙන භූමි කලාපයයි. මෙහි ඉතා ඉපැරණි වූත් ඖෂධීය වටිනාකමින් යුතු වූත් නා ශාකය විශාල වශයෙන් පැතිර පවතී. ඉතිහාසගත කරුණු අනුව ජාතික නාමල් උයන ලොව පැරණිම ඉතිහාසයක් ඇති එකම මිනිස් අභය භූමිය වේ. මෙය ජෛව විවිධත්වය අතින් ද පොහොසත් පරිසර පද්ධතියකි. මෙය ශ්‍රී ලංකාවේ ඓතිහාසික රාජධානි සමූහයක් ආශ්‍රය කරගෙන පිහිටා තිබීම විශේෂත්වයකි. අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, දඹුල්ල, අවුකන ආදී ඓතිහාසික ස්ථාන සමූහයක් ආශ්‍රිතව ජාතික නාමල් උයන පිහිටා ඇත. මෙයට අමතරව මෙම වනෝද්‍යානය තුළ ඇති නැවුම් වාතාශ්‍රය හා සිසිලස වනෝද්‍යානය නරඹන්නන් අමන්දානන්දයට පත්කරයි.

අතීත ශ්‍රී විභූතයෙහි සුවඳ මතු පරපුර වෙතද එලෙසින්ම දායාද කිරීම උදෙසා මෙම පාරිසරික කලාපය සුරැකීම අප කාගේත් යුතුකමක් බව අවධාරණය කළ යුතු කරුණකි.

ජේ.පී. ශාන්ති
ප්‍රචාරක නිලධාරී
පරිසර අමාත්‍යාංශය